## මූලික කරුණු ලේඛනය

HSBC පුද්ගලික විශේෂිත ප්‍රතිචක්‍රීය ණය **("PERC")** පහසුකමක් සඳහා අයදුම් කරමින්, අප කෙරෙහි තැබූ විශ්වාසය ගැන ඔබට ස්තුතියි. පැහැදිලි හා විනිවිද භාවයෙන් යුත් ක්‍රියාවලියක් සහතික කිරීම පිණිස, පහසුකම සම්බන්ධ මූලික නීතිරීති සහ කොන්දේසි අප විසින් පහතින් දක්වා ඇත. කරුණාකර ඒවා කියවා බලන්න.

පුද්ගලික විශේෂිත ප්‍රතිචක්‍රීය ණය **("PERC")**

| **සුදුසුකම් සපුරාලීම** | **අවශ්‍ය ලේඛන** |
|---|---|
| • වයස අවුරුදු 18 - 60 අතර වීම.<br>• රු. 100,000/- ක අවම මාසික වැටුපක් ඉපැයීම.<br>• සේවයේ ස්ථිර කළ නිත්‍ය සේවකයකු වීම. | • නිසි ලෙස අත්සන් කළ අයදුම්පත.<br>• ඔබේ ගනුදෙනුකරු දැනගන්න (KYC) පිළිබඳ ලේඛන.<br>• මෑත කාලීන එක් මසක වැටුප් පත්‍රිකාව.<br>• වැටුප දැනටමත් බැර කර නොමැති අවස්ථාවක දී, වැටුප ප්‍රේෂණය කරන බැව් තහවුරු කෙරෙන ලිපිය.<br>• රැකියා තත්ත්වය තහවුරු කෙරෙන ලිපිය හෝ සතුටුදායක රැකියා තත්ත්වය සත්‍යාපනයට විෂය වීම. |

**සුරක්ෂිත අයිරා පහසුකම (Smart Money)**

| | |
|---|---|
| **සුදුසුකම් සපුරාලීම** | HSBC හි ඕනෑම දේශීය ශාඛාවක, රු. 100,000/-ක හෝ විදේශ ව්‍යවහාර මුදලින් ඊට සමාන වටිනාකමකින් යුතු අවම ස්ථාවර තැන්පතුවක් සහිත නව හෝ වත්මන් හෝ HSBC ගනුදෙනුකරුවකු වීම. |
| **ප්‍රතිලාභ කෙටියෙන්** | • ඔබේ ස්ථාවර තැන්පතුවෙන් 90%ක් දක්වා ආපසු ගැනීමේ හැකියාව.<br>• සුරක්ෂිත අයිරා සීමාවෙන් භාවිත කළ මුදලට පමණක් පොලී ගෙවන්න. ණය සංචිතය භාවිත කර නොමැති නම්, කිසිදු පොලියක් අය නොකෙරෙයි. |

| | |
|---|---|
| | • නව කාල තැන්පතුවක් සිදු කිරීම මගින්, ඕනෑම අවස්ථාවක දී Smart Money පහසුකමට අදාළ ව දී ඇති අයිරා සීමාව ඉහළ නැංවිය හැකියි.<br>වැඩි විස්තර සඳහා පිවිසෙන්න:<br>http://www.hsbc.lk/loans/products/smart-money/ |

- PERC අයදුම්පතක් අනුමත කිරීම, ද හොංකොං ඇන්ඩ් ෂැංග්හායි බැන්කිං කෝර්පරේෂන් ලිමිටඩ්, ශ්‍රී ලංකා ශාඛාව ("HSBC, බැංකුව") හි පරම අභිමතය පරිදි වේ.
- ඔබේ මාසික වැටුප මෙන් කිහිප ගුණයක් දක්වා නම්‍යශීලී මුදල් ලබාගැනීමේ හැකියාව PERC පහසුකම වෙතින් ලැබේ.
    - Premier - ලබාගත හැකි සීමාවන් සම්බන්ධයෙන් කරුණාකර ඔබේ සබඳතා කළමනාකරු හා සම්බන්ධ වන්න.
    - Advance - ආදායම මෙන් හතර ගුණයක් (4x)
    - වෙනත් - ආදායම මෙන් දෙගුණයක් (2x)
- හිඟව පවතින ශේෂයෙන් 5%ක ආපසු ගෙවීමේ අවම මුදලක් හෝ රුපියල් දෙසිය පණහ (රු.250/-) ක් යන දෙක අතරින් ඉහළ අගය ගනුදෙනුකරු විසින් ප්‍රකාශන දින හෝ ඊට පෙර ගෙවිය යුතුයි.
- හිඟව පවතින ශේෂය මත දෛනිකව පොලිය ගණනය කර, එක් එක් මාසයේ ප්‍රකාශන දිනයේ දී PERC ගිණුම වෙත අය කෙරෙනු ඇත.
- ගනුදෙනුකරු හට අවශ්‍ය මුදල පමණක් ණය වශයෙන් ලබාගත හැකි අතර, ඔබ පොලී ගෙවිය යුත්තේ, ඔබේ සමස්ත ණය සීමාව වෙනුවෙන් නොව, ඔබ ලබාගත් ණය මුදලට පමණි. ඔබට ලබා දී ඇති ණය සංචිතයෙන් කිසිදු මුදලක් ඔබ ලබා නොගත් විට, කිසිදු පොලියක් අය කෙරෙන්නේ නැත.
- PERC පහසුකම් සඳහා වන පොලිය, කලින් කලට වෙළඳපොල පොලී අනුපාතවලට අනුව බැංකුව විසින් තීරණය කරන පරිදි වෙනස්වීමට යටත් වනු ඇත.
- ගෙවීම් කාලසීමාවේ දී ගෙවීමට නියමිත අවම මුදල ගෙවීමට අපොහොසත් වීම, PERC ගිණුම වෙත රු. 250ක ප්‍රමාද ගෙවීම් ගාස්තුවක් අය කර, හර කිරීමට හේතු වනු ඇත. මෙකී ගාස්තුව වෙනස් වීමට විෂය වන අතර, බැංකුවේ නිල වෙබ් අඩවිය වන www.hsbc.lk හි දැක්වෙන එකී අනුපාතිකයන්, බැංකුවෙහි ගාස්තු ලේඛනය මගින් ප්‍රකාශයට පත් කරනු ලබයි.

- PERC පහසුකමෙහි කිසියම් අවලංගු කිරීමක් සහ/හෝ අය කරගැනීමක් සම්බන්ධයෙන් බැංකුව විසින් නෛතික ගාස්තු ද ඇතුලුව දරනු ලබන සියලු ගාස්තු, අයකිරීම් සහ වියදම් සඳහා පූර්ණ හානිපූරණ පදනමක් මත ගනුදෙනුකරු වගකියනු ලැබේ.
- මෙම අයදුම්පත HSBC වෙත ලැබුණු පසුව, අවශ්‍ය සියලු ලේඛන නිසි ලෙස වේ නම්, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට සාමාන්‍යයෙන් ගත වන්නේ අවම වශයෙන් පැය 48ක් (බැංකු වැඩකරන දින 02) ක් පමණි.
- HSBC විසින් මෙම අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී මෙම අයදුම්පත සමග වන අනෙකුත් සියලුම ලේඛන විනාශ කිරීමේ අයිතිය HSBC රඳවා ගනියි.
- විදේශ විනිමය සම්බන්ධයෙන් වර්තමානයේ බලපැවැත්වෙන හා කලින් කලට සංශෝධනය කෙරෙනු ඇති නීතිරීති ද ඇතුළුව නමුත්, ඊට සීමා නොවී, ශ්‍රී ලංකාවේ නීතිරීති සහ රෙගුලාසි වලින් බැඳී සිටීමට ගනුදෙනුකරු එකඟව භාරගනියි.

**තොරතුරු හෙළිදරව් කිරීම**

- බැංකුව විසින් පත් කරන ලද ඕනෑම තෙවැනි පාර්ශ්වයක සේවා සපයන්නන් වෙත, සමූහයේ ඕනෑම කාර්යාලයක් වෙත, බැංකුවට සුදුසු යැයි හැඟන රජයේ ආයතන සහ/හෝ නියාමකයන් වෙත ගනුදෙනුකරු සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය කිරීම සඳහා ඔහු/ඇය විසින් බැංකුවට බලය ලබා දෙයි. බැංකුව සමග මා හට තවදුරටත් PERC පහසුකමක්/පහසුකම් නොතිබුණේ වුවද, මෙම කැමැත්ත බලාත්මකව පවතියි.
- ඔබගේ **HSBC පුද්ගලික විශේෂිත ප්‍රතිචක්‍රීය ණය (PERC)** පිළිබඳ වැඩි විස්තර සඳහා අපගේ නීතිරීති කොන්දේසි වෙත පිවිසෙන්න: https://www.hsbc.lk/loans/products/smart-money/

**ඔබේ ප්‍රතිචාර සහ පැමිණිලි අප වෙත දැන්වීමට කැමැති නම්, කරුණාකර අප අමතන්න.**

ඔබ වෙත සේවාවන් සැපයෙන ආකාරය සම්බන්ධයෙන් ඔබ පූර්ණ වශයෙන් සතුටට පත් නොවේ නම්, හෝ අපගේ සැලසුම් මගින් ඔබගේ අපේක්ෂාවන් ඉටු නොවේ නම්, කරුණාකර පහත විකල්ප භාවිතයෙන් හැකි ඉක්මනින් අප හා සම්බන්ධ වන්න:

- පාරිභෝගික විසඳුම් ක්ෂණික ඇමතුම් අංක + 94 114 511 566 හරහා සම්බන්ධ වන්න.
- ඔබේ ගැටලුව customersolutions@hsbc.com.lk වෙත ඊමේල් කරන්න.
- අප වෙත ලියන්න:

  කළමනාකරු - පාරිභෝගික සේවා,<br>
  පාරිභෝගික බෙදාහැරීම් සහ වත්කම් කළමනාකරණ<br>
  අංක 24, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01

අප වෙත මතු කරන ඕනෑම කරුණක් ඔබ සම්පූර්ණයෙන් සතුටට පත්වන ආකාරයට විසඳීමට අප කැමති වන අතර, මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යාලය වෙත ලිපියක් ලියා ප්‍රතිකර්මයක් ඉල්ලා සිටීමේ හැකියාව ද ඔබට ඇත. ඔම්බුඩ්ස්මන්වරයා සමග සම්බන්ධ විය හැකි ආකාරයන් පිළිබඳ තොරතුරුː

මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය - ශ්‍රී ලංකා

- ලිපිනය : 143 A, වජිර පාර, කොළඹ 05
- දුරකථන : + 94 112 595 625
- ෆැක්ස් : + 94 112 595 624
- ඊමේල් : info@financialombudsman.lk
- වෙබ් : www.financialombudsman.lk

**HSBC|Perc|KFD|May-2024 (S)**